# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.04.05 පැය 1740 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/655/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


**ගරු ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය වෙනුවෙන් අනුරාධපුර නගරය ආශ්‍රිතව ක්‍රියාත්මක රථවාහන සැළැස්ම සම්බන්ධව.**

ගරු ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය අප්‍රේල් මස 04 වන දින ආරම්භ විය.

2025.04.06 වන දින ගරු ඉන්දීය අග්‍රාමාත්‍ය තුමා අනුරාධපුර ප්‍රදේශයේ සංචාරය කිරීමට නියමිත බැවින් එදින පැය 08.30 සිට පැය 11.00 දක්වා කාලය තුළ පහත සඳහන් මාගර් වසා තැබීමට කටයුතු කරන බැවින් පහත විකල්ප මාගර් භාවිතා කරන ලෙසට පොලිසිය මහජනතාවගෙන් සහ රියදුරන්ගෙන් ඉල්ලා සිටියි.

**<u>අනුරාධපුර ගුවන් හමුදා කඳවුරේ සිට ශ්‍රී මහා බෝධිය දක්වා ගමන් කිරිම.</u>**

**<u>මාගර්ය වසා තැබීම සම්බන්ධව</u>**

- අනුරාධපුර ගුවන් හමුදා කඳවුර සිට ශ්‍රී මහා බෝධිය දක්වා වූ පහත සඳහන් මාගර්යන් පැය 08.30 සිට (රෝහල් වටරවුම, හරිස්චන්ද්‍ර මාවත, පළාත් සභා වටරවුම, ඔරලෝසු කණුව වටරවුම, කුරුණෑගල හන්දිය දක්වා ) විටින් විට වසා තබන අතර එම කාලය තුළ පහත විකල්ප මාගර්යන් භාවිතා කළ හැක.

**<u>විකල්ප මාගර්</u>**

- කැකිරාව, මරදන්කඩවල, ගල්කුලම, කවරක්කුලම හරහා ගුවන්තොටුපල මාගර්ය හරහා අනුරාධපුර නගරය දෙසට ගමන් කරන වාහන ගුවන් හමුදා කඳවුර ඉදිරිපිටින් වමට ඇති විජයපුර දෙසට මාගර්ය ඔස්සේ නගරයට ඇතුළුවිය හැක.

- කැකිරාව, මරදන්කඩවල, ගල්කුලම, කවරක්කුලම හරහා ගුවන්තොටුපල මාගර්ය හරහා අනුරාධපුර නගරය දෙසට ගමන් කරන වාහන කවරක්කුලම හන්දියෙන් මාතලේ හන්දිය, යාපනය හන්දිය හරහා අනුරාධපුර නගරයට ඇතුළුවිය හැක.

- කුරුණෑගල ඒ - 28 මාගර්යේ හා පුත්තලම ඒ - 12 මාගර් වලින් පැමිණෙන වාහන පොතානේගම හන්දිය හරහා අනුරාධපුර නගරයට ඇතුළු විය හැකි අතර පූජා නගරයට ඇතුළු වන වාහන පුත්තලම් පාර පණ්ඩුලගම වටරවුමෙන් දකුණට ඇති තිසා වැව දෙසට වු මාගර්ය භාවිතා කල හැක.

- වව්නියාව හා මිහින්තලය දෙසින් අනුරාධපුර නගරය හරහා පුත්තලම, කුරුණෑගල දෙසට ගමන් කිරීමට පැමිණෙන වාහන යාපනය හන්දිය වටරවුමෙන් දකුණට ඇති පූජා නගරයට ඇතුළු වන මාගර්ය ඔස්සේ කොහොඹගස් හන්දිය. ථූපාරාම හන්දිය, බසවක්කුලම, තිසාවැව, පණ්ඩුලගම වටරවුම හරහා ගමන් කල හැක.

## ශ්‍රී මහා බෝධිය අසල සිට අනුරාධපුර දුම්රිය ස්ථානය දක්වා ගමන් කිරීම

- ශ්‍රී මහා බෝධිය අසල සිට අනුරාධපුර දුම්රිය ස්ථානය දක්වා ගමන් කිරීමට නියමිත අතර කුරුණෑගල හන්දිය, ඉසුරුමුණිය ඔරලෝසු කණුව වටරවුම, ජයන්ති වටරවුම, වික්ටරි හන්දිය, සිංහ කණුව වටරවුම, දුම්රිය ස්ථානය දක්වා මාගර්ය වසා තැබෙන අතර එම කාලය තුල පහත විකල්ප මාගර් භාවිතා කල හැක.

## විකල්ප මාගර්

- කුරුණෑගල ඒ - 28 මාගර්යේ හා පුත්තලම ඒ - 12 මාගර් වලින් පැමිණ පොතානේගම හන්දිය හරහා පූජා නගරයට ඇතුළුවන වාහන පුත්තලම් පාර පණ්ඩුලගම වටරවුමෙන් දකුණට ඇති තිසා වැව දෙසට වූ මාගර්ය භාවිතා කල හැක.

## අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට ගුවන් හමුදා කඳවුර දක්වා ගමන් ගන්නා මාගර්ය වසා තැබීම.

- අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට නැවත අනුරාධපුර ගුවන් හමුදා කඳවුර දක්වා සිංහ කණුව වටරවුම, වික්ටරි හන්දිය, ඔරලෝසු කණුව වටරවුම, පළාත් සභා වටරවුම, හරිස්චන්ද්‍ර මාවත, රෝහල් වටරවුම, ගුවන් හමුදා කඳවුර දක්වා මාගර්ය වසා තැබෙනු ඇත.

## විකල්ප මාගර්

- කැකිරාව, මරදන්කඩවල, ගල්කුලම, කවරක්කුලම හරහා ගුවන්තොටුපල මාගර්ය හරහා අනුරාධපුර නගරය දෙසට ගමන් කරන වාහන ගුවන් හමුදා කඳවුර ඉදිරිපිටින් වමට ඇති විජයපුර දෙසට වූ මාගර්ය ඔස්සේ අනුරාධපුර නගරයට ඇතුළුවිය හැක.

- කැකිරාව, මරදන්කඩවල, ගල්කුලම, කවරක්කුලම හරහා ගුවන්තොටුපල මාගර්ය හරහා අනුරාධපුර නගරය දෙසට ගමන් කරන වාහන කවරක්කුලම හන්දියෙන් මාතලේ හන්දිය, යාපනය හන්දිය හරහා අනුරාධපුර නගරයට ඇතුලු විය හැක.

- කුරුණෑගල ඒ - 28 මාගර්යේ හා පුත්තලම ඒ - 12 මාගර් වලින් පැමිණ පොතානේගම හන්දිය හරහා පූජා නගරයට ඇතුළුවන වාහන පුත්තලම් පාර පණ්ඩුලගම වටරවුමෙන් දකුණට ඇති තිසා වැව දෙසට මාගර්ය භාවිතා කල හැක.

- වව්නියාව හා මිහින්තලය දෙසින් පැමිණෙන වාහන පුත්තලම, කුරුණෑගල දෙසට ගමන් කිරීම සදහා අනුරාධපුර නගරයට ඇතුලු නොවී අනුරාධපුර යාපනය හන්දිය වටරවුමෙන් දකුණට ඇති පූජා නගරයට ඇතුලු වන මාගර්ය ඔස්සේ කොහොඹගස් හන්දිය. ථූපාරාම හන්දිය, බසවක්කුලම, තිසාවැව, පණ්ඩුලගම වටරවුම හරහා ගමන් කළ හැක.

මෙම කාලය සීමාව තුළ රථවාහන හසුරුවන ලබන පොලිස් නිලධාරින්ගේ මඟපෙන්වීම මත රථවාහන ධාවනය කරන ලෙස මහජනතාවගෙන් හා රියදුරන්ගේ ශ්‍රී ලංකා පොලිසිය ඉල්ලා සිටියි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**